www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ඇමරිකා එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ සම්මේලනයේ සම්මත වූ යෝජනා

**Resolution of the Socialist Equality Party Congress**

# කම්කරු විප්ලවවාදී පක්ෂය සමග භේදයේ පටන් විසිපස් වසරක්

## Twenty-Five Years Since the Split with the Workers Revolutionary Party

**2010 අගෝස්තු 30**

*එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂය සිය ප්‍රථම වාර්ෂික ජාතික සමුළුව 2010 අගෝස්තු 11-15 අතර මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර්හි දී පවත්වන්නට යෙදුනි. සමුළුවේ යෝජනා හා වාර්තා ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් ප්‍රකාශයට පත් කරනු ලබයි. සමුළුවේ පලමු දිනයේ දී ඒකමතිකව සම්මත කර ගත් "කම්කරු විප්ලවවාදී පක්ෂය සමග භේදයේ පටන් විසිපස් වසරක් ගතවෙයි" යන ඒ යෝජනාව මෙහි පලකරමු. ලෝසවෙඅ* ***"ලියොන් ට්‍රොට්ස්කි ඝාතනයේ හැත්තෑවෙනි සංවත්සරය වෙනුවෙන්"*** *යන යෝජනාව මීට පෙර පලකරන ලදී.*

★★★

සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රථම ජාතික සම්මේලනය, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) සියලු ශාඛාවන්හි සිය සම චින්තකයන් හා සහෝදරවරුන් වෙත තම උනුසුම් ශුභපැතුම් පිරිනමයි.

සසප සමුලුව පවත්වන්නට යෙදුනේ ජාත්‍යන්තර කම්කරු පන්තියේ හා මාක්ස්වාදයේ වර්ධනයෙහිලා ප්‍රගාඪ වැදගත්කමක් දරන සංවත්සරයක් අභිමුඛයේ ය. ජාත්‍යන්තර කමිටුව හා බ්‍රිතාන්‍යයේ කම්කරු විප්ලවවාදී පක්ෂය අතර හටගත් භේදයට විසිපස් වසරක් පිරෙන්නේ ද මේ වසරේදී ය. මෙම දේශපාලන අරගලය, හජාජාක හා ට්‍රොට්ස්කිවාදයේ අසාමාන්‍ය වර්ධනයක් වෙනුවෙන් මාවත එලි කලේය. එය, අප සමුලුවේ කටයුතු පදනම් වන මූලධර්මාත්මක න්‍යායික හා දේශපාලන අත්තිවාරම් ආරක්ෂා කර පොහොසත් කරයි.

1985-86 භේදය වූ කලී, හතරවන ජාත්‍යන්තරය තුල සංශෝධනවාදයට එරෙහි තිස් වසරකට වැඩි කාලයක අරගලයේ කුලුගැන්වීමයි. වසර 1953දී එක්සත් ජනපද සමාජවාදී කම්කරු පක්ෂයේ (එස්ඩබ්ලිව්පී) නිර්මාතෘවරයා වූ ජේම්ස් පී කැනන්ගේ නායකත්වයෙන් යුත් සම්භාව්‍ය ට්‍රොට්ස්කිවාදීහු, හතරවන ජාත්‍යන්තරයේ ක්‍රියාමාර්ගයට ඉදිරිපත් කල පුලුල් සංශෝධනයන්ට විරුද්ධ වූහ. පැබ්ලෝ හා මැන්ඩෙල් විසින් හතරවන ජාත්‍යන්තරය බිඳ දැමීම සඳහා දරන ලද උත්සාහයට එරෙහිව ඔවුහු පොරබැදූහ. සංශෝධනවාදී ක්‍රියාමාර්ගයට එරෙහිව ලෝකය පුරා ට්‍රොට්ස්කිවාදීන් එක්සත් කිරීම සඳහා ජාත්‍යන්තර කමිටුව පිහිටවූ "විවෘත ලිපිය" කැනන් විසින් ලියන ලදී. පැබ්ලෝවාදී ප්‍රවනතාවය හතරවන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ක්‍රියාමාර්ගයට එරෙහි සුලු ධනපති හා අවස්ථාවාදී කැරැල්ලක් නියෝජනය කලේය. "පැරනි ට්‍රොට්ස්කිවාදය කුනු කූඩයට දැමීමේ" සිය අරමුන විවෘතව ප්‍රකාශයට පත් කරමින් එය හතරවන ජාත්‍යන්තරයේ විප්ලවවාදී මාක්ස්වාදී ක්‍රියාමාර්ගය හා කම්කරු පන්තිය වෙතට වූ එහි දිශානතිය පිලිකෙව් කලේය. ලියොන් ට්‍රොට්ස්කි විසින් ආරක්ෂා කර වර්ධනය කලාවූ ඔක්තෝබර් විප්ලවයට මඟ පෙන්වන ලද ඓතිහාසික ක්‍රියාමාර්ගයේ පදනම මත බලය සඳහා අරගලය, ඔවුහු ප්‍රතික්ෂේප කලහ. මෙම සංශෝධනවාදී ප්‍රවනතාවය, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කාලයේදී දේශපාලන ආධිපත්‍ය දරන ලද ස්ටැලින්වාදී, සංශෝධනවාදී හා ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාරයන්හි උපාංගයක් බවට ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය ලඝු කිරීමට වෑයම් කලේය.

පැබ්ලෝ හා මැන්ඩෙල් සමඟ භේද වීමේදී 1950 ගනන්වල තමන් දරා සිටි ප්‍රතිපත්ති කෙරෙන් සමාජවාදී කම්කරු පක්ෂය (එස්ඩබ්ලිව්පී), පල්ලම් බැසීම අරඹා තිබුනි. 1953 භේදයට තුඩුදුන් තීරනාත්මක ක්‍රියාමාර්ගික ප්‍රශ්න සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කරමින් එස්ඩබ්ලිව්පීය, 1963 දී සංශෝධනවාදීන් සමඟ ප්‍රතිපත්ති විරහිත එකමුතුවක් සඳහා වැඩ කලේය. ජෙරී හීලිගේ නායකත්වයෙන් යුත් ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව මෙම පාවාදීමට එරෙහි විය. බලවේගයන්ගේ ජාත්‍යන්තර දේශපාලන සබඳතා සංශෝධනවාදීන්ට හිතකර වූ නමුදු, මූලධර්ම විරහිත ප්‍රතිපත්ති වලට

එරෙහිව ගෙන ගිය හීලිගේ සටන හතරවන ජාත්‍යන්තරය දියකර හැරීම වලකා ලූ අතර ජාත්‍යන්තර කමිටුවට නව බලවේග දිනා ගැනීමට සමත් විය. සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ, 1966 දී පිහිටුවන ලද වර්කර්ස් ලීගය හිස එසවූයේ ඍජුව ම බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් විසින් ගෙන ගිය අරගලය තුලිනි. හජාජාක අනෙකුත් ශාඛා ශ්‍රී ලංකාවේ, ජර්මනියේ හා ඕස්ට්‍රේලියාවේ වර්ධනය විය. 1970 ගනන්වල දී කම්කරු විප්ලවවාදී පක්ෂය ලෙස ස්ථාපිත කරන ලද බ්‍රිතාන්‍ය සංවිධානය, පැබ්ලෝවාදීන්ට බෙහෙවින් හුරු පුරුදු දේශපාලන සංකල්ප කරා ඇදී ගියේය. බ්‍රිතාන්‍ය නායකත්වය එන්ට එන්ටම ජාතිකවාදී දිශානතියකට නැඹුරු විය. එය ජාත්‍යන්තර ව්‍යාපාරය දැකගනු ලැබුවේ එංගලන්ත පක්ෂයේ හුදු පරිවාරකයක් ලෙස ය.

කම්කරු විප්ලවවාදී පක්ෂය (කවිප) මෙම මාර්ගය අනුයද්දී වර්කර්ස් ලීගයේ අධිෂ්ඨානශීලී විරුද්ධත්වයට මුහුන දුන්නේය. ඇමරිකානු ට්‍රොට්ස්කිවාදීහු ප්‍රතිවිරුද්ධ පරාවක්‍රයක් ඔස්සේ වර්ධනය වෙමින් සිටියේ ය. 1970 ගනන් පුරා වර්කර්ස් ලීගය, තීරනාත්මක ලෙස කම්කරු පන්තිය වෙත හැරීම සඳහා එය ගෙන ගිය වැඩ කටයුතුවල හරි මැද, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික අත්දැකීම්, විශේෂයෙන්ම පැබ්ලෝ-මැන්ඩෙල් සංශෝධනවාදයට එරෙහිව ගෙන ගිය අරගලයේ අත්දැකීම්, තැබුවේ ය.

වසර 1982 මුලදී, එවකට වර්කර්ස් ලීගයේ ජාතික ලේකම්ව සිටි ඩේවිඩ් නෝර්ත් විසින් කවිපයේ න්‍යායික හා දේශපාලන අපසරනයන්ට එරෙහිව වර්ධනය කරන ලද ගැඹුරට විහිද ගිය විවේචන තුල මෙම විරුද්ධත්වය සිය නිශ්චිත ප්‍රකාශනය අත්කර ගත්තේය. කවිපය, පැබ්ලෝවාදී ව්‍යාපාරයේ පිරිහීමට සමාන්තරවූ රේඛා ඔස්සේ ධනේශ්වර ජාතිකවාදයට යටත්වීම හා නොනවතින විප්ලවයේ න්‍යාය අතහැර දැමීම නෝර්ත් හෙලිදරව් කලේය. එසේම ඔහු, කවිපයේ දේශපාලන අවස්ථාවාදය හා මාක්ස් ද එංගල්ස් ද විසින් වර්ධනය කල භෞතිකවාදී දර්ශනවාදය පිලිබඳව හීලි කල ආත්මීය විඥානවාදී විකෘතිකරනය අතර සම්බන්ධය ද විශ්ලේෂනය කලේය. මෙම න්‍යායික පරිහානිය, ඊනියා "බටහිර මාක්ස්වාදයේ" හා ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලයේ බලපෑම යටතේ, මාක්ස්වාදයට හා විශේෂයෙන්ම ඓතිහාසික භෞතිකවාදයට එරෙහිව ගෙන ගිය පුලුල් ප්‍රහාරයක කොටසක් විය.

1982 ඔක්තෝබර් හා 1986 පෙබරවාරි අතර කාලය තුල වර්කර්ස් ලීගය විසින් මතුකල, පැබ්ලෝවාදය කරා වූ මෙම පල්ලම් බැසීම පිලිබඳ බැරෑරුම් න්‍යායික හා දේශපාලනික විවේචන සාකච්ඡා කිරීම හීලි විසින් ප්‍රතික්ෂේප කිරීම, කවිපය තුල හිස ඔසවමින් තිබුනු දේශපාලන ගැටලු ජයගැනීමට තිබුනු ඉඩකඩ කල් තබාම වසා දැමීය. මෙම තත්වය, 1985 ගිම්හානයේ බ්‍රිතාන්‍ය ශාඛාව අභ්‍යන්තරයේ පුපුරා ගිය සංවිධානාත්මක අර්බුදය සඳහා වේදිකාව සැකසීය. මෙම වාතාවරනය තුල නෝර්ත් විසින් පූර්ව තෙවසර තුල වර්ධනය කර තිබුනු විවේචන ජාත්‍යන්තර කමිටුව තුල වේගයෙන් සහයෝගය දිනා ගනිමින් නව ට්‍රොට්ස්කිවාදී බහුතරයක් එය තුල සංකේන්ද්‍රනය කිරීමේ පදනම දැමූ අතර කවිපයේ අවස්ථාවාදී නායකත්වය පසුපාදයේ තැබීය.

ජාත්‍යන්තර කමිටුවෙන් බිඳී ගිය සියල්ලෝම වේගයෙන් දකුනට ගමන්ගෙන පරිහානිගත විය. කවිපය බිඳී යාමෙන් මතුව ආ එකම ශක්‍ය දේශපාලන ප්‍රවනතාවය වූයේ, ජාත්‍යන්තර කමිටුවේ බහුතරයට හා ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයට සහයෝගය දීමට ඒකරාශී වූ ඩේව් හයිලන්ඩ් විසින් නායකත්වය දුන් බ්‍රිතාන්‍ය සහෝදරවරුන් විශාල කන්ඩායම නියෝජනය කල ප්‍රවනතාවය පමනි.

ජාත්‍යන්තර කම්කරු පන්තිය හා මාක්ස්වාදය සඳහා භේදය කොතරම් වැදගත් වී ද යන්න, ඉන් ක්ෂනික ඉක්බිත්තෙහි පැනනැංගාවූ දැවැන්ත ඓතිහාසික සිදුවීම් පිලිබඳව එහි පූර්වාපේක්ෂාව තුලින් පෙන්නුම් කලේය. 1953 නැගෙනහිර ජර්මනියේ ද 1956 හන්ගේරියාවේ හා පෝලන්තයේ ද හටගත් කම්කරුවන්ගේ නැගිටීම් සමඟ අත්වැල් බැඳගෙන ස්ටැලින්ගේ බොහෝ අපරාධ හෙලිදරව් කරමින් කෘෂෙව් කල කථාව මගින් සලකුනු කල ස්ටැලින්වාදයේ ඓතිහාසික අර්බුදය ආසන්නයේ 1953 සිදුවූ පැබ්ලෝවාදය සමඟ භේදය සේ ම, ස්ටැලින්වාදයේ අර්බුදය, නිලධරය විසින් සෝවියට් සංගමය බිඳ දමා ධනවාදය පුනරුත්ථාපනය කිරීම කරා ගමන් කල, එහි අවසාන අදියර කරා එලඹෙද්දී කවිපය සමඟ භේද වීම සිදුවිය.

ස්ටැලින්වාදී නිලධාරි තන්ත්‍රයන්ගේ බිඳ වැටීම වනාහි, ස්ටැලින්වාදීන්ගේ සිට සංශෝධනවාදීන් හා එක්සත් ජනපදයේ ප්‍රති කොමියුනිස්ට්වාදී ඒඑෆ්එල්-සීඅයිඕ යන ජාතිකවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම් වූ කම්කරු ව්‍යාපාරයේ සෑම නායකත්වයක්ම වෙලාගත් පුලුල් අර්බුදයක කොටසක් විය. ලෝක ආර්ථිකයේ වෙනස්කම්, අන් සියල්ලටමත් වඩා ධනේශ්වර නිෂ්පාදනයේ පෙර නොවූ විරූ ගෝලීය ඒකාග්‍රකරනය, මෙම ජාතික ප්‍රතිසංස්කරනයේ ක්‍රියාමාර්ග යල්පැන ඇති බව හෙලිදරව් කලේය.

භේදයේ මූලික බෙදුම් රේඛාව වැටී තිබුනේ එක් අතකින් විප්ලවවාදී ජාත්‍යන්තරවාදයත් අනෙක් අතින් ජාතික අවස්ථාවාදයත් අතර ය. ජාත්‍යන්තර කමිටුවේ ශාඛා බහුතරයක් විසින් ජාත්‍යන්තරවාදය ආරක්ෂා කිරීම මගින් ව්‍යාපාරය, වෛෂයික තත්වයේ

ගැඹුරට විහිදුනු වෙනස්කම් හා ඒවායේ ඉමහත් විප්ලවවාදී ශක්‍යතාවය සමග සම්බන්ධ කලේය. භේදයෙන් පසුව ජාත්‍යන්තර කමිටුව විසින් සම්පාදනය කල දැවැන්ත න්‍යායික හා දේශපාලනික දැනුම් සම්භාරය විප්ලවවාදී ජාත්‍යන්තරවාදයේ ඉදිරිදර්ශනය පිලිබඳ බලගතු පුනර්ජීවයක් සඳහා පදනම නිර්මානය කලේය.

මෙම වැදගත් දේශපාලන සංවත්සරය පවත්වන මේ අවස්ථාවේ දී සසප ජාතික සම්මේලනය, 1985-86 අරගලය තුල මූලික ක්‍රියා කලාපයක් ඉටුකල ජාත්‍යන්තර කමිටුවේ සහෝදරවරුන්, විශේෂයෙන්ම ජර්මානු ශාඛාවේ පීටර් ෂ්වාස් හා උලී රිපට් ද ඕස්ට්‍රේලියානු ශාඛාවේ නික් බීම්ස් ද කව්පප අවස්ථාවාදීන්ට එරෙහිව බ්‍රිතාන්‍ය විරුද්ධ පාර්ශවය මෙහෙයවූ ඩේව් හයිලන්ඩ් හා ක්‍රිස් මාස්ඩන් වෙත සිය බලවත් ප්‍රසාදය පලකරනු ලබයි.

කම්කරු විප්ලවවාදී පක්ෂය සමග භේදයේ සංවත්සරය හමුවේ සමාජවාදී සමානතා පක්ෂය, ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ප්‍රධාන ලේකම්ව සිටි කීර්ති බාලසූරිය සහෝදරයාගේ මතකය වෙනුවෙන් සිය ප්‍රනාමය පුද කරයි. 1987 දෙසැම්බරය වනවිට 39 වන වියෙහි පසුවූ ඔහුගේ අභාවය, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සිටි ශ්‍රේෂ්ඨතම නායකයෙකුගේ වියෝවයි.

1964 ලංකා සමසමාජ පක්ෂයේ මහා පාවාදීම කෙරෙහි විරුද්ධත්වය තුලින් හැඩ ගැසුනු දේශපාලන මූලධර්ම දරා සිටි කීර්ති බාලසූරිය, නොනවතින විප්ලවයේ ඉදිරිදර්ශනය අශමනීය ලෙස ආරක්ෂා කල අයෙකු විය. දශකයක ගමන් මගෙහි දී ඔහු, කවර කලෙකටත් වඩා විවෘත ලෙස ස්ටැලින්වාදයටත් ධනේශ්වර ජාතිකවාදයටත් අනුගත වෙමින් සිටි කව්පප නායකත්වය සමග ගැටුනේය. 1985 දී කීර්ති සහෝදරයා කව්පප ජාතික අවස්ථාවාදී නායකත්වයට එරෙහිව ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් බහුතරය සමග ඒකාබද්ධ වෙමින්, මෙම අරගලය තුලට පැබ්ලෝවාදයට එරෙහි සටන තුල ඔහු ලැබූ දිගු කාලීන අත්දැකීම් ගෙන ආ අතර ට්‍රොට්ස්කිවාදය සඳහා තමන්ගේ දැවැන්තම ප්‍රතිපදානය කලේය. ඔහුගේ අභාවයට පූර්ව වසර දෙක තුල ජාත්‍යන්තර කමිටුවේ දේශපාලන පුනර්ජීවනය තුල තීරනාත්මක හා ආදේශ නොකල හැකි ක්‍රියා කලාපයක් ඔහු ඉටු කලේය.

පසුකෙරෙන සෑම වසරක් පාසා ම 1985-86 භේදයේ දුරදිග යන ඇඟවුම් වඩ වඩාත් පැහැදිලි වෙයි. 1985-86 භේදය, ක්‍රියාමාර්ගික වශයෙන් ඒකාග්‍ර ජාත්‍යන්තර ව්‍යාපාරයක් බවට ජාත්‍යන්තර කමිටුව පරිවර්තනය කිරීමේ හැකියාව ගෙන දුන්නේය. අනෙක් අතට මෙය, සමාජවාදී සමානතා පක්ෂය පිහිටුවීමටත් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වර්ධනය කිරීමටත් මග හෙලිකලේය.

මාක්ස්වාදයේ සම්ප්‍රදායන්, න්‍යාය, මූලධර්ම හා ක්‍රියාමාර්ගයේ පදනම මත සිය වැඩ කටයුතු ගෙන යන මෙම ග්‍රහලෝකයේ තිබෙන එකම පක්ෂය හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවයි. ගෝලීය ධනවාදයේ ගැඹුරුවන අර්බුදයේ හා ජාත්‍යන්තර පන්ති අරගලයේ නව පිබිදීමක කොන්දේසි යටතේ ජාත්‍යන්තර කමිටුව, කම්කරු පන්තියේ වඩාත්ම සවිඥානක, සටන්කාමී හා ස්වයං කැපකිරීමෙන් යුත් කොටස් ආකර්ෂනය කරගන්නවා ඇත.

© www.wsws.org